# ශිලාලේඛනවල අන්තර්ගත අක්ෂර නොවන සංකේත පිළිබඳ අධ්‍යයනයක්

(මූල බ්‍රාහ්මීය හා අපර බ්‍රාහ්මීය අවධියට අයත් තෝරාගත් ශිලාලිපි කිහිපයක් ඇසුරින්)

කේ.පඤ්ඤානන්ද හිමි[1], පී. විමලසුධීර හිමි[2]

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
[1]pagngnananda123@gmail.com, [2]wimalasudeera@gmail.com

ප්‍රමුඛ පදඃබ්‍රාහ්මීය ශිලාලේඛන, සංකේත, සාක්ෂරතාව, සමාජ ස්තර, සමාජීය වැදගත්කම

## හැඳින්වීම

අඛණ්ඩ ඉතිහාසයකට උරුමකම් සපයන සියලු ශ්‍රී ලාංකිකයන් සතුව වසර දෙදහසකට වැඩි කාල පරාසයකට අයත් බ්‍රහ්මීය ලිපි සමූහයක් පවතී. ඒවා උතුර, උතුර මැද, වයඹ, දකුණ, ආදී ශ්‍රී ලංකාවේ නොයෙක් ප්‍රදේශවල ව්‍යාප්තය වී තිබේ. මෙම ශිලාලේඛන පර්වත, ගල්ගුහා අශ්‍රිතව දක්නට ලැබේ. මෙම ශිලාලේඛන විද්වතුන් විසින් යුග වශයෙන් වර්ග කර දක්වා ඇත. ඒ අනුව බ්‍රහ්මීය යුගය, පූර්ව බ්‍රහ්මීය යුගය, අපර බ්‍රහ්මීය යුගය හා පශ්චාත් බ්‍රහ්මීය යුගය වශයෙන් වර්ග කර දක්වා ඇත. මූල බ්‍රහ්මීය යුගය (ක්‍රිඃපූඃ 3 සිට ක්‍රිඃවඃ 1) හා අපර බ්‍රහ්මීය යුගය (ක්‍රිඃවඃ1 සිට ක්‍රිඃවඃ7 දක්වා) ශිලාලේඛනවල අක්ෂර රූපවලට අනුරූප නොවූ සංකේත විශේෂයක් වේ. ඒවා බ්‍රහ්මීය නොවන සංකේත ලෙස හඳුන්වයි. අක්ෂර ආරම්භයේ සිට ම ධ්වනිත වූ මෙම සංකේත අක්ෂර පේළි ආරම්භයේ, අවසානයේ හෝ අක්ෂර පේළිවල උඩින් හෝ යටින් දැකිය හැකිය. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ මූල බ්‍රාහ්මීය හා අපර බ්‍රාහ්මීය අක්ෂර ලේඛනයෙහි ඇති සංකේත මගින් පැරණි සමාජයේ වෘත්තීන් හා සාමාජීය ක්‍රමය හා සම්බන්ධ සමාජ ස්තර අධ්‍යනය කිරීමයි. එහි දී ශ්‍රී ලංකාවේ මූල බ්‍රාහ්මීය හා අපර බ්‍රාහ්මීය අභිලේඛනයන්හි දක්නට ලැබෙන සංකේත මඟින් නිරූපිතාර්ථය කුමක් ද? යන්න පරීක්ෂා කරනු ලැබේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දත්ත රැස්කිරීම සඳහා විධික්‍රම කිහිපයක් භාවිත කරන ලදී. එහි දී අප විසින් ගුණාත්මක දත්ත රැස්කිරීම සඳහා පළමුවෙන්ම ප්‍රාථමික හා ද්විතියක මූලාශ්‍රය පරිශීලනය හා පුස්තකාල පරිහරණය කරන ලදී. අන්තර්ජාල භාවිතය ආදී විධික්‍රම යොදා ගන්නා ලදී. මේ සදහා මූල බ්‍රාහ්මීය හා අපර බ්‍රාහ්මීය අවධියට අයත් තෝරාගත් ශිලාලිපි කිහිපයක් ආශ්‍රය කරගන්නා ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්‍රි ලංකාවේ මානව ජනාවාස කවදා, කොතනක ආරම්භ වූයේ දැයි නිශ්චිත වශයෙන් හඳුනාගත නොහැකිය. මුල්ම මානවයන් තම සංක්‍රාන්තික අවදිය පසු කරමින් නව දියුණු තත්වයක් කරා පැමිණීමට බොහෝ කාලයක් ගතවන්නට ඇත. ඒ අතරතුර ඔව්හු ආර්ථික වශයෙන් මෙන්ම සමාජ, දේශපාලනික, වශයෙන් ශක්තිමත් වෙමින් නව චින්තන ධාරාවක් ඔස්සේ තමන්ට අනන්‍ය වූ ක්‍රමවේදයන් ගොඩනගා ගත්හ. එහි ප්‍රතිඵලය අදටත් අප භුක්ති විඳී. ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවයේ ආරම්භය පිළිබඳව

විද්වතුන් තුළ ඇත්තේ පරස්පර විරෝධී අදහස් ය. එහෙත් මෙරට සාක්ෂරතාවයේ ආරම්භය පිළිබඳව පොදු මතය වන්නේ ක්‍රිෘපූ තුන්වැනි සියවසේ ආරම්භ වූ බවයි (Paranavithana, 1970). එහෙත් අනුරාධපුර ගෙඩිගේ කැණීමෙන් ලැබුණු සාධක තුළින් පොදුවේ පිළිගත් මතයන් බණ්ඩනයට ලක් කිරීමට සමත් වී තිබේ.

දැනට ශ්‍රී ලංකාවෙන් ලැබුණු අභිලේඛන යුගවලට පුරාවිද්‍යාඥයින් කොටස් කර දක්වයි.

- බ්‍රාහ්මීය යුගය (ක්‍රිෘපූ: 3 සිට ක්‍රිෘව 7)
- මූල බ්‍රාහ්මීය යුගය (ක්‍රිෘපූ: 3 සිට ක්‍රිෘව 1)
- අපර බ්‍රාහ්මීය යුගය (ක්‍රිෘව: 1 සිට ක්‍රිෘව 7)
- පශ්චාත් බ්‍රාහ්මීය යුග (ක්‍රිෘපූ: 8 සිට ක්‍රිෘව 15)

මෙහි දී මූල බ්‍රාහ්මීය හා අපර බ්‍රාහ්මීය ශිලාලේඛනවල අක්ෂර රූපවලට අනුරූප නොවූ සංකේත විශේෂයක් වේ. ඒවා බ්‍රාහ්මීය නොවන සංකේත ලෙස හඳුන්වයි. (Paranavithana, 1970 XXV-XXVI) මෙවැනි සංකේත තුළින් ධ්වනිත කරනුයේ කුමක් ද යන්නට අදටත් නිවැරදි නිශ්චිත අදහසක් නොමැත. මෙවැනි සංකේත ශිලාලේඛනවල ආරම්භයේ, අවසානයේ, සහ අක්ෂර පේළිවලට උඩින් හෝ යටින් දක්නට ලැබේ. බ්‍රාහ්මීය අක්ෂර අතර ඇති මෙම සංකේත ඉන්දුනිම්න චිත්‍රාක්ෂරවල ද පවතින බව ඉන්දු නිම්න චිත්‍රාක්ෂර අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ (පරණවිතාන, 1962, 217). වචන විග්‍රහ කිරීම වෙනුවට ලිවීමේ උපක්‍රමයක් ලෙසින් සංකේත භාවිත වූ බවත් සිතිය හැකිය. ඊට හේතුව සංකේත ආශ්‍රයෙන් බොහෝ දේ පැහැදිලිව හා නිරවුල්ව අවබෝධ කර ගැනීමට හැකි වීමයි.

ශිලාලෙඛන ගැඹුරින් අධ්‍යයනය කිරීමේ දී සංකේතවලින් ප්‍රකාශ වන අර්ථය පැහැදිලිව තේරුම් ගත හැකිය. සමස්තයක් වශයෙන් මෙවැනි සංකේත ආශ්‍රයෙන් ගම්‍යවන අර්ථයන් කොටස් කිහිපයකට වර්ග කළ හැකිය.

- සෞභාග්‍ය හැඟවීමේ සංකේත.
- තනතුරු නාම හැඟවීමේ සංකේත.
- පුද්ගල නාම හා පරම්පරා හැඟවීමේ සංකේත.
- වෘත්තීය හැඟවීමේ සංකේත.
- විරාම සංකේත.
- වටිනාකම හැඟවීමේ සංකේත.
- වෙනත් සංකේත.

මූල බ්‍රාහ්මීය ශිලාලේඛනවල විද්‍යාමාන වන බ්‍රාහ්මී නොවන සංකේත පිළිබඳ අධ්‍යයනය කළ පරනවිතාන සංකේත 43 ක් හඳුනාගෙන තිබේ (Paranavithana, 1970: XXV-XXVI). එහෙත් එයින් ගම්‍යවන අර්ථය පිළිබඳ අදහස් ඉදිරිපත් කර ඇත්තේ සංකේත කිහිපයකින් පමණි. පැරණි ලාංකික සමාජය විසින් සුභ සංකේත යැයි හඳුන්වන කිහිපයක් බ්‍රාහ්මීය ශිලාලේඛන තුළ දැකිය හැකිය. ස්වස්තික සලකුණ එවැන්නකි. යහපතක්ම වේවා යන්න නිරූපණය කිරීමේ දී ස්වස්තිකය භාවිත කළ බව ශිලාලේඛන තුළින් විද්‍යාමාන ය (Paranavithana, 1983), (Paranavithana, 2001).මොලාහිටියවෙලේගල ලිපියේ ආරම්භයේ දකුණු පස ස්වස්තික ලකුණ යොදා ඇත. (Paranavithana, 1983 No 18, P1.X) මෙයට අමතරව එම සංකේතය ඇත්වෙහෙර ද දක්නට ලැබේ. වේවැල්තැන්න ලිපියේ (Paranavithana, 1970 No 208 P1XXV) වත්ස සංකේතය නිරූපණය කොට ඇත. නෙළුම් මලේ සංකේතය ද සෞභාග්‍ය පෙන්වීමට යොදාගෙන ඇත.

ගමණී යනුවෙන් සඳහන් බ්‍රාහ්මී ශිලාලේඛන බොහෝ ප්‍රමාණයක ගරාදි වැට සහිත සලකුණ දක්වේ. (Paranavithana, 1970) ගමණී පූර්ව රාජ්‍ය අවධියේ සිටි පාලකයින් පිරිසකි. ඒ අනුව ගමණී යන තනතුර හැඟවීම සඳහා ගරාදි වැට සහිත සංකේතය භාවිතා වූ බව සිතිය හැකිය. මූල බ්‍රාහ්මීය ශිලාලේඛන තුළින් පුද්ගල නාම හා පරම්පරා නාම සංකේතවත් කරන සංකේත රාශියක් හමුවේ. ශිලාලේඛනවල තනිව හෝ වෙනත් සංකේත සමග ගරාදි වැට සහිත ස්වස්ථිකය දක්නට ලැබේ. ස්වස්ථික ලකුණෙන් **"තිශ"** යන නාමය නියෝජනය වන බව පරනවිතාන මහතා ප්‍රකාශ කරයි. (Paranavithana, 1970, XXV – XXVI) මත්ස්‍ය ලකුණින් පුද්ගලික නාමයක් නියෝජනය වේ. (Paranavithana, 1970- XXVI) මේ ආදි වශයෙන් පුද්ගල නාම හා පරම්පරා පිළිබඳ සංකේත ශිලාලේඛන තුළින් නිරූපණය වේ.

දුටුගැමුණු රාජුගේ රාජකීය දුනු දරන්නා වූ නන්දිමිත්‍ර පිළිබඳ සඳහන් නැට්ටුක්කන්ද, සිතුල්පව්ව, කොරවග්ගල ආදී ශිලාලේඛනවල ඊතල දෙකක් හරහට බැඳ ඇති ආකාරයේ සංකේත වේ. මේ සංකේතය නන්දිමිත්‍රගේ වෘත්තීය පිළිබිඹු කරයි. (Paranavithana, 1970: NOS 166 P1XVIINOS 620 629, P1IXXIX)

විරාම සංකේතය ලෙස ස්වස්ථිකය යොදා ගෙන තිබේ. රත්නප්‍රසාද පුවරු ලිපිය, අභයගිරිය දාගැබ මළු ලිපිය ආදී ස්ථානවල විරාමය සංකේතය ලෙස ස්වස්ථිතිකය යොදා ඇත. විරාම සංකේත ලෙස සිරස් හා තිරස් රේඛා භාවිත කර තිබේ. තිත් දෙක සහ තිත් තුන ද යොදා තිබේ. (Paranavithana, 1983 No 59 PlXXVII) ක්‍රි.ව 2-4 සියවස්වලට අයත් ශිලාලේඛනවල වටිනාකම් හැඟවීම සඳහා යොදාගත් සංකේත වේ. කරීස භූමි ප්‍රමාණය පිළිබඳව සඳහන් කරන ඇතැම් අවස්ථාවල දී චතුරස්‍රයක උඩ හා යටි දිශාවන්ට යෙදූ කෙටි රේඛා 4කින් මෙම සංකේතය නිරූපණය කර ඇත. (Paranavithana, 1983) වෙනත් සංකේත වශයෙන් ස්වාභාවික වස්තු සංකේත ලෙස භාවිතා කර ඇත. තාරකා සංකේතය කන්දේගමකන්ද ලිපියේ කොටා ඇත. (Paranavithana, 1970 No 289,PlXXVIIl) මිනිසාගේ නෙත ගැටෙන සංකේත ශිලාලේඛනවල පිටපත්කර ඇත. ශ්‍රී ලංකාවේ මුල් බ්‍රාහ්මී හා අපර බ්‍රාහ්මී ශිලාලේඛනවල ඇති සංකේත මඟින් විද්‍යාමාන වන්නේ පැරණි සමාජය තුළ පැවති සමාජ ක්‍රමයේ කැඩපතයි.

**සමාලෝචනය**

මූල බ්‍රාහ්මී හා අපර බ්‍රාහ්මී ශිලාලේඛන තුළින් විද්‍යාමාන වන බ්‍රාහ්මීය නොවන සංකේත පිළිබඳ විමර්ශණය කිරීමේ දී පැරණි යුගයේ සමාජ ක්‍රමයේ විවිධත්වය ගම්‍යමාන කරයි. තම කුලය, ගෝත්‍රය, වෘත්තීය, විශ්වාසය, දියුණුව හා සියළු දේ මෙන්ම වචන බොහෝමයක් ලිවීම වෙනුවට සංකේත භාවිතය සිදුකර ඇති බවට සිතිය හැකිය. යම් සංකේතයක් මඟින් විශාල අදහසක් සමාජගත කිරීම මෙම සංකේතාර්ථයන්ගේ අදහසයි. දියුණු වර්තමානයේ යම් ස්ථානයක් හැඳින්වීමට යොදා ගන්නා වූ ලාංඡන (logo) මෙන් පැරණි සමාජයේ මෙම සංකේත භාවිතා කරන්නට ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Paranavitana, s. (1970) ***Inscription s of Ceylon.*** Vol.1.Colombo: Department of Archaeology.

බණ්ඩාර, නිලන්ති. (2008)***පුරාණ ශ්‍රී ලංකාවේ සමාජය.*** කඩුල්ල ප්‍රකාශකයෝ.

විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ. (1995)***ශිලාලේඛන සංග්‍රහය.*** දොඩන්ගොඩ, ඩී.ජී.(සංස්). මොරටුව.